## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
## (නාරා ආයතනය)

### <u>තනතුරු පුරප්පාඩු</u>

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් පිළිබඳ විෂය සම්බන්ධයෙන් පර්යේෂණ සංවර්ධන හා කළමනාකරණ කටයුතු සිදුකරන හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම භාර ප්‍රධාන ජාතික ආයතනය වේ.

නියෝජිතායතනයේ පහත සඳහන් පුරප්පාඩු වූ තනතුරු සඳහා අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයින්ට අවස්ථාව විවෘත වේ.

| | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| 01 | කළමණාකරණ සහකාර | ➢ අධ්‍යාපන<br>අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,<br>i සිංහල/දෙමළ<br>ii ගණිතය<br>iii ඉංග්‍රීසි<br>යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් :-<br>➢ අවශ්‍ය වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද<br>• පිළිගත් ආයතනයක පරිගණක භාවිතය පිළිබඳව හය මසකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම සහ විනාඩියට වචන 40 ක් යතුරුලියනය කිරීමේ හැකියාව<br>• ලඝු ලේඛනය/යතුරු ලේඛනය පිළිබඳ පිළිගත් ආයතනයක සහතිකයක් ලබා තිබීම.<br>• පරිගණකය මගින් දත්ත සැකසීම පිළිබඳව පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>• අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>වයස අවු: **18** ට නොඅඩු හා අවු: **45** ට නොවැඩි අය විය යුතුය.<br>වැටුප් පරිමාණය **MA 1-2-2016: 27,910-10x 300-7x350-12x600-12x710-49,080/-**<br>**(2-2016 චක්‍රලේඛ ප්‍රකාරව 2020 සිට ක්‍රියාත්මක වේ.)** |
| 02 | රියදුරු - | ➢ අධ්‍යාපන<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) සමත් වී තිබිය යුතුය.<br>➢ අපේක්ෂිත නිපුණතා<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම හා මෝටර් රථ රියදුරු බලපත්‍රය (බර වාහන) ලැබීමෙන් පසු අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්ද ලබා තිබීම.<br>වයස අවු: 21 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය.<br>වැටුප් පරිමාණය **PL 3-2016: 26,290-10x 270-10x300-10x330-12x350-39,490/-**<br>**(2-2016 චක්‍රලේඛ ප්‍රකාරව 2020 සිට ක්‍රියාත්මක වේ.)** |

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
IV. නාරා ආයතනයෙහි කාර්ය මණ්ඩලයට බලපාන පොදු නීතිවලට මෙම තනතුරු යටත් වේ.
V. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය නාරා ආයතනය සතුය.
VI. ඉහත තනතුරු සඳහා තේරී පත්වන්නන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට හිමිකම් කියනු ඇත.

ඒ අනුව මාසික වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු වන අතර, නියෝජිතායතනය විසින් ස්වකීය සම්පත්වලින් වැටුපෙන් 15% ක් එම අරමුදලට දායක කරනු ඇත.

සේවක භාරකාර අරමුදලට දායක වශයෙන් වැටුපෙන් **3%** ක් වන දායක මුදලක් නියෝජිතායතනය විසින් එම අරමුදලට දායක කරනු ඇත.

**2018/08/06** දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ සියලු අයදුම්පත් අදාල සහතිකපත්වල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය සේවයේ/ව්‍යවස්ථාපිත මණ්ඩලවල/සංස්ථාවල නිලධාරීන්ගේ අයදුම්පත් තම අදාල දෙපාර්තමේන්තු/ආයතනවල ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය**
**කාක දූපත,**
**මට්ටක්කුලිය,**
**කොළඹ 15**